# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය இணைந்த சேவைகள் பிரிவு COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணைத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය / எனது இல / My No: CS/DOS/05/03/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2017.08.22

**සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්/**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්/**

**දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.**

**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සහන ලබා දීම - සංවර්ධන නිලධාරී සේවය.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2016.06.10 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියේ 03 ඡේදය අනුව කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම සඳහා සහන කාලයක් ලබා ගැනීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් EC(EST 07) ආකෘතිය ප්‍රකාරව මා වෙත යොමු කරන මෙන් දන්වා ඇතත්, ඒ සම්බන්ධයෙන් ලැබෙන විශාල ඉල්ලීම් ප්‍රමාණය මත ඇති වී තිබෙන ප්‍රායෝගික ගැටළු හේතුවෙන් එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් අදාළ ආකෘතිය සම්පූර්ණ කර මා වෙත එවීම අවශ්‍ය නොවන බව කාරුණිකව දන්වා සිටිමි.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2016 හි 04 ඡේදය අනුව ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයන්හට කාර්යක්ෂමතා කඩඉම් සහන සඳහා අනුමැතිය ලබා දීම මා වෙත පැවරී ඇති බැවින් අදාල චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව අනුගාමී විභාග අවස්ථා 06ක් තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිර කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි මා වෙත එවීම ප්‍රමාණවත් බවත්, එම ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසුව නියමිත සහන කාලය ලබා දී, එම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයේ පත්වීමෙහි තනතුරේ ස්ථිර කිරීම මා විසින් සිදු කර දන්වා එවන බවත් වැඩිදුරටත් දැනුම් දෙමි

**කේ.වී.පී.එම්.ජේ.ගමගේ**

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**

සංවර්ධන නිලධාරීන් සම්බන්ධ ලිපි යොමු කිරීමේදී අදාල නිලධාරියාගේ පත්වීම් ලිපි අංකය(CS/DOS/XXXXX) සඳහන්